පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019

# ක්‍රිස්තියානි ධර්මය

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..........................................

.................................................................................................................. කාලය : පැය 02 යි.

## II කොටස

**පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ජුදෙව් සමාජයේ බලාපොරොත්තුව කුමක්ද? එය ඉටු කළේ කවුද?
    (ii) රෝම අධිරාජ්‍යයට ගැතිකම් කළ කණ්ඩායම් **දෙක** නම් කරන්න.
    (iii) ස්නාවක යොහාන් තුමා තම ශ්‍රාවකයන්ට යේසුස් වහන්සේව හඳුන්වා දුන්නේ කෙසේද?
    (iv) දිව්‍යසි වැකි විශ්වාස නොකළ නිසා සෙකරියස් තුමා මුහුණ දුන් ඇත්දැකීම් **දෙකක්** ලියන්න.
    (v) දේව දූතයා සුබාරංචිය රැගෙන ප්‍රථමයෙන් ගියේ කොහාට ද?
    (vi) ජොහාන් තම සේවය ආරම්භ කරන තෙක් සිටියේ කොහේද?
    (vii) පව්කරුවන් ලෙස සමාජයෙන් ප්‍රතික්ෂේප වූවන් **දෙදෙනෙක්** ලියන්න.
    (viii) නික්මයාමේ සිද්ධිය හා සම්බන්ධ වන වත් පිළිවෙත කුමක්ද?
    (ix) මෙසියස් යන හෙබ්‍රෙව් වචනයේ ග්‍රීක වචනය ලියන්න.
    (x) අද සමාජයේ ජීවත් වන අපට ස්නාවක යොහාන්ගේ අනුසාසනාවෙන් ලැබෙන පණිවිඩ **දෙකක්** ලියන්න.

(ලකුණු 2X10=20)

02. (i) දිව්‍යසිවර කාර්යයන් ලියන්න. (ලකුණු 02)
    (ii) කිතු උපත හා බැඳි දිව්‍යසිවැකියක් ලියන්න. (ලකුණු 03)
    (iii) එම දිව්‍යසිවැකියෙන් සනාථ වූ අවස්ථා තුළින් අපට අවධාරණය කළ පණිවිඩ **පහක්** ලියන්න. (ලකුණු 05)

03. (i) දේව රාජ්‍ය හඳුන්වන්න. (ලකුණු 02)
    (ii) දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ භූමිකා හඳුන්වන්න. (ලකුණු 03)
    (iii) දේව රාජ්‍ය ඔබ අතරේය යන වදන කිතුනු අප ක්‍රියාවට නංවන්නේ කෙසේද? (ලකුණු 05)

04. (i) යේසුස් වහන්සේ දේව රාජ්‍යය හඳුන්වා දීමටත්, යහපත් දිවි පැවැත්මක් සඳහාත් කළ දේශනය කුමක්ද? (ලකුණු 02)
    (ii) එම දේශනයේ සැබෑ සැපත හිමිකර ගත හැකි භාග්‍යයන් මොනවාද? (ලකුණු 03)
    (iii) වර්තමාන සමාජයට මෙම භාග්‍යයන් හා අභාග්‍යයන් කෙසේ පිළිගැන්විය හැකිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

Education NCP - www.edncp.lk

05. (i) ආබ්‍රහම්ගේ පුත්‍රකමේ උරුමය ජේසුස් වහන්සේ ලබා දුන්නේ කාටද? (ලකුණු 02)

(ii) මොහුගේ ජීවිත පෙරළිය ක්‍රියාවට නැංවූ ආකාරය ලියන්න. (ලකුණු 03)

(iii) අපගේ ජීවිතයේ වෙනස් කළ යුතු දේ මොනවාද යන්න සඳහන් කර ඒ පිළිබඳ පසුතැවිලි වීමේ යාච්ඤාවක් ලියා දක්වන්න. (ලකුණු 05)

06. (i) කමාව වීම හා කමාව ලැබීම ජීවිත ගමනට අඩිතාලමක් වන්නේ කෙසේද? (ලකුණු 02)

(ii) කමා වීම ගැන යේසුස් වහන්සේගේ ඉගැන්වීම් **තුනක්** ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 03)

(iii) ජේසුස් වහන්සේ ඔබේ වරදට කමා කළා සේ ඔබත් එකිනෙකාට කමා කරන්න. මෙම විනයෙහි පිහිටා ගෙදරදී, පාසලේ දී, සමාජයේ දී ක්‍රියා කරන ආකාරය ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ජේසුස් වහන්සේගේ කැප කිරීම

(ii) ජුදෙව් පාස්කු මංගල්‍යය

(iii) මුල් ගෝලයන් කැඳවීම

(iv) අන්තිම රාත්‍රී භෝජනය

(ලකුණු 5X2=10)

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
10

# දෙවන වාර පරීක්ෂණය - 2019

## ක්‍රිස්තියානි ධර්මය

## පිළිතුරු පත්‍රය

### I කොටස

01. (3) දිව්‍යසිවරුන් ලෙස ය.
02. (1) දෙවියන් වහන්සේ අප සමගයි.
03. (2) යෙසායා ය.
04. (3) මලාකි ය.
05. (4) ජේසුතුමාගේ සේවකත්වය හා පරිත්‍යාගශීලිත්වය
06. (2) මරියතුමී විසිනි.
07. (3) ජේසු තුමා ය.
08. (2) ජුදයේ බෙත්ලෙහෙමට ය.
09. (4) ඉහත සියල්ලම යි.
10. (3) චර්මඡේදනය පිළිවෙත කළ අවස්ථාවෙහි ය.
11. (1) ගලීලය
12. (2) ස්නාවක යොහාන් විසින් ආරක්ෂක අංශයට ය.
13. (1) දෙවියන් වහන්සේගේ වැඩසිටීම යි.
14. (3) විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවනු ලැබූ
15. (1) පේදුරු ය.
16. (2) සීමොන්
17. (1) ස්වර්ගයේ නම ලියවී ඇති නිසා ය.
18. (4) වචනය ඇසීම හා පිළිපැදීම
19. (1) කුදු ස්ත්‍රිය යි.
20. (2) සමාරිතයන්
21. (1) දේව රාජ්‍යයේ වටිනාකම් අප තුළ ගොඩනංවාගත යුතු බව යි.
22. (1) දිනාර් ය.
23. (2) සහෝදරත්වයෙන් හා සහයෝගයෙන් ජීවත් විය යුතු බව යි.
24. (1) නුමුහුන් රොටී මංගල්‍යය
25. (1) මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා.
26. (4) මේ සියල්ලන් විසිනි.
27. (1) සැන්හෙන්ඩ්‍රින් ය.
28. (1) ඔහු ජේසුස් වහන්සේගේ නිර්දෝෂී බව දැකීම නිසා ය.
29. (3) කපාල කන්ද ය.
30. (1) දෙවි සමිඳුන් වෙතට ළඟා වීමට තිබූ බාධක ඉවත් වීම (2) හිරු අඳුරු වීම
31. (1) පේදුරුගේ මහා ප්‍රකාශනය යි.
32. (3) නිරන්තර යාච්ඤාව හා ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම
33. (1) සිරේනියේ සීමොන් ය.
34. (3) කුරුසපත්වීම පරාජයක් නොව විජයග්‍රහණයක් වීම
35. (2) අරිමාතියේ ජෝසප් ය.
36. (1) උන්වහන්සේගේ උත්ථානය යි.
37. (4) ඉහත සියල්ලලම නිසා ය.

38. (1) දේව අභිමුඛාවය හා බලයත් පායෙන් දවාලා පිරිසිදු වීමත් ය.
39. (1) ස්නාවක යොහාන්ගේ පෙරමඟ දූත සේවය අනුමත කිරීම යි.
40. (3) යහපත් ජීවිත පැවැත්මකින් අපට සිටින අයට ආලෝකයක් වීම යි.

## II කොටස

01. (i) මෙසියස්ගේ පැමිණීම/ ජේසුස් වහන්සේ
(ii) අයකැමියන්/ පරිසිවරු/ සද්දිසිවරු/ ලියන්නන්
(iii) ලෝකයේ පව් දුරු කරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ
(iv) දරුවා ඉපදී නම් තබන තෙක් ගොළු වීම
(v) එඬේරුන් වෙතට
(vi) පාළුකරයේ
(vii) පරිසිවරුන්/ සද්දුසිවරුන්
(viii) කුළුඳුලන් කැප කිරීම
(ix) ක්‍රිස්ටොස්
(x) අභියෝග මගින් සහෝදරත්වයෙන් ආත්මාර්තකාමී නොවී තමාට ඇති දේ බෙදා ගනිමින් එකිනෙකාව පෝෂණය කරමින් ජීවත්වීම

(ලකුණු 2X10=20)

02. (i) දෙවියන් වහන්සේගෙන් ඈත්ව සිටි දේව ජනතාව අදමිටුකම්වලින් මුදවා ගෙන උන්වහන්සේ වෙත ගෙනඒම (ලකුණු 02)
(ii) අන්ධකාරයේ ඇවිද්ද සෙනඟ ඔහත් ආලෝකයක් දුටුවේ ය.
අපට ළදරුවෙක් උපන්නේ ය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය. (ලකුණු 03)
(iii) කිතු උපත දිළිඳි ලෙස සිදුවීම
ළදරු ඝාතනය
දිළිඳුන්ට ශුභාරංචියක්
වැනි අදහස් (ලකුණු 05)

03. (i) මුළු විශ්වය කෙරෙහි පවතින දෙවියන් වහන්සේගේ ආධිපත්‍යයයි. (ලකුණු 02)
(ii) සේවක නායකත්ව භූමිකාව/ අන් අය වෙනුවෙන් වැය වීම/ හැකියාවන් උපරිම අන්දමින් සේවයේ යෙදවීම/ ස්ථානෝචිත ප්‍රඥාව (ලකුණු 03)
(iii) සිසු අදහස්වලට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i) මිටියාවතේ දේශනාව (ලකුණු 02)
(ii) දිළිඳු ඔබ භාග්‍යවන්තයි - දේව රාජ්‍ය ඔබගේ ය.
සාගිනි වූ ඔබ භාග්‍යවන්තයි - තෘප්තියට පැමිණෙනු ඇත.
කඳුළු හෙළන ඔබ භාග්‍යවන්තයි - සිනාසෙනු ඇත.
ප්‍රතික්ෂේප වූ ඔබ භාග්‍යවන්තයි - ස්වර්ගරාජ්‍යයට උරුම වේ. (ලකුණු 03)
(iii) සිසු අදහස්වලට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05. (i) ජේසුස් වහන්සේ අපගේ වරදට කමා වූ බැවින් අපත් එකිනෙකාට කමා වීම එයින් හෘද සාක්ෂිය පිරිසිදු වේ. ආදී අදහස් (ලකුණු 02)

(ii) ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව අපට වරද කරන ... සත්වාරයක් නොව සැත්‍ැවාරයකි.
සොහොයුරා සමඟ අමනාපයක් ඇත්නම් පූජාව ඔප්පු කිරීමට පෙර සමගි වීම
සතුරන්ට ප්‍රේම කිරීම (ලකුණු 03)

(iii) සිසු අදහස්වලට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) සාකෙවුස් (ලකුණු 02)

(ii) තමා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට ද අයුතු ලෙස ගත් අයට හතර ගුණයක් ද ලබා දීම (ලකුණු 03)

(iii) සිසු අදහස්වලට ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07. (i) කුලුදුල් ජුදෙව් පිරිමි දරුවන් ඉපදී දින 40ක් ගතවූ විට කැප කරයි.
පරවි පැටවුන් දෙදෙනෙකු හෝ කොබෙයියන් දෙදෙනෙක් පූජා කිරීම
සිමියොන් හා අන්නා දේව මාලිගාවේ සිටීම
ආදී කරුණු..

(ii) දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බැම්මෙන් මුදවා ගෙන මෝසෙස්ගේ නායකත්වය තුළින් කානාන් දේශයට ගෙන ඒමේ සිදුවීම ...

(iii) ජේසුස් වහන්සේ තිබේරියස් විල අසල දී දේශනා කරමින් සිටීම. එහි පිරිසක් මාළු අල්ලමින් සිටීම. ඔරු දෙකක් ඉල්ලා ගෙන දියඹට යාම. මුල් ගෝලයන් කැඳවීම, තිබේරියස් විල අසල සිදුවීම...

(iv) සිදුවීමට අදාළ කරුණුවලට ලකුණු ලබා දෙන්න.

(ලකුණු 5X2=10)

***

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**
**Learn Ordinary Level**

LOL.lk
online Book Store

LOL.lk

අමතන්න - 071 777 4440/0756999990/071 8540371




# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්වා ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

